
නිවන් මග පිළිබඳ අප්‍රකට තොරතුරු රැසක් හෙළි කරන

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
# සහ
# අක්ෂෝභය සූත්‍රය





සකස් කළේ
නිලන්ත හෙට්ටිගේ



# පෙරවදන

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මහායානිකයන්ට අයත් එකක් බවට බොහෝ දෙනෙක් අතර වැරදි විශ්වාසයක් ඇත. මහායානිකයන් අත්‍ර පවතින්නේ නිවැරදි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය නොව මාර බලයට යටත්වූ බමුණු පිරිස විසින් ගොතන ලද ප්‍රබන්ධයකි.

බුදුන් වහන්සේ විසින් තුසිත දෙව්ලොවදී මාතෘ දිව්‍යරාජයාට දේශනා කරන ලද්දේ නියම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයයි. මෙතෙක් කල් රහසක්ව පැවති නිවැරදි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සොයා ගිය ගමනේදී මා ඉදිරියේ පහළ වූ මංජු ශ්‍රී බෝසතාණන් විසින් මේ සූත්‍ර ධර්මය හෙළිකිරීම ආරම්භ කරන ලදී. තවත් බෝධිසත්වවරු දෙදෙනෙක්ද යෝගිනියක්ද සූත්‍රය අතර මැදදී ඊට සම්බන්ධ වූහ. මෙහි එන කරුණු අනුපිළිවෙලකට ඉදිරිපත් කර නැත්තේ එබැවිනි. කරුණු අනුපිළිවෙලට ගළපා ඉදිරිපත් කිරීමට මට හැකිවුවත් එසේ සිදුකර නැත්තේ එවැන්නක් කිරීමට ධර්මානුකූලවේද යන්න සැක සහිත බැවිනි. සමහර මහායානිකයන් තමනුත් මුලාවේ වැටී අනුන්ද මුළාවේ හෙළන ආකාරය සද්ධර්ම පුණ්ඩරීකයෙහි එන කරුණු වලින් මැනවින් අවබෝධ කරගත හැකිය.

මෙම සූත්‍රධර්මයෙහි එන සිද්ධිමය කරුණු යටින් විවිධාකාර ගුප්තාර්ථ මතුවන බව පැහැදිලිව පෙනේ. ස්ත්‍රීන් නැති ලෝක, කම්මැලි බෝධිසත්වයින්, කල්ප ගණන් ආයුෂ ඇති මිනිසුන් වැනි ප්‍රවෘත්ති තුළින් සසර පැවැත්මෙහි යථාර්ථ ස්වභාවය පිළිබඳ ගැඹුරු අරුත් ගෙන එයි.

ඉතා දුෂ්කර ලෙස දැන උගත් මේ සූත්‍රධර්මය තුළින් සකලලෝවාසී සත්වයින්ගේ සසර දුක නිවීමට අපමණ ප්‍රයෝජන ගතහැකි බව හැඟේ.

**සංස්කාරක**
0777 185279

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය

ශ්‍රී බුද්ධ වර්ෂ දෙදහස් පන්සිය පනස් පහක් වූ නවම් මස අව දොළොස්වක නම් තිථිය ලත් දින රාත්‍රී යාමයේදී දෙවියකුද නොවන යක්ෂයෙකුද නොවන සූක්ෂ්ම ශරීරයක් සහිත සත්වයෙක් මා ඉදිරිපිට පෙනී සිට තමා මංජු ශ්‍රී යන නාමයෙන් හැඳින්වෙන බව හඬගා කීය. මම ඔහුට සවන් දුනිමි. බුදු දහම පිළිබඳව මෙතෙක් හෙළි නොකළ වැදගත් රහසක් කියා දෙන්නට මෙලොවට පැමිණි බව මංජු ශ්‍රී කියා සිටියේය. මා හටද තවත් එක් යෝගියෙකු හටද එකහා සමාන ලෙස කියාදුන් ඒ කථා ප්‍රවෘත්තිය සැකෙවින් මෙසේය.

"මම මංජු ශ්‍රී නම් වෙමි. ඈත සක්වලක ඇති මනුෂ්‍ය වාසයක සිට මනෝමය කයින් ඔබවෙත පැමිණයෙමි. මා එන මග මනුෂ්‍යවාස දහහතරක්ද, ලෝකාන්තරික නිරයවල් දහතුනක්ද විය. සෑම සක්වල දෙකක් අතර ම ලෝකාන්තරික නිරයකි. ලෝකාන්තරික නිරයට නොවැටී බේරී යාමට කාලතරණ උපක්‍රමය භාවිතා කළෙමි. පළමුව මම ගමනාන්තය සිහි කළෙමි. දෙවනුව ඍද්ධි බලයෙන් ආකාශ ධාතුව හකුළුවා උමගක් තැනුවෙමි. මාගේ ප්‍රකෘති කය එලොව තිබියදී සූක්ෂ්ම කයින් කාලතරණය කර මෙලොවට පැමිණියෙමි.

මා වෙසෙන ලෝකධාතුව තුළ සිටින සත්වයෝ දීර්ඝ ආයුෂ භුක්ති විඳිති. ඔවුන්ගේ කාලනිර්ණ ක්‍රමය අනුව එහි ආයුෂය වර්ෂ අනූදහසකි. ඔබගේ ලෝකයේ කාලනිර්ණය අනුව කල්ප ගණනක ආයුෂ අපට ඇත.

මෙලොව පදුමුත්තර බුදුන් බුදු බව ලබන විටදී මම එලොව ඉපිද සිටියෙමි. ඒ ලෝකය තුළ දැනට බුදුවරයෙක් වැඩ වසති. අමිතාභ නම් ඒ බුදුවරයා පිළිබඳ ඒ රහස කෝණාගමන බුදුන් වහන්සේ විසින් මෙලොවට හෙළිකරනු ලැබීය. ඒ හේතුවෙන් පෘථිවියේ මිනිසුන් අතර මහත් කැළඹීමක් හටගත්තේය. එකල මිනිස් ලොව විසූ ඔබද තවත් යෝගියෙක්ද වීර්ය වඩා ධ්‍යාන බලයෙන් අපගේ ලෝකයට පැමිණ ඒ තොරතුරු වල සත්‍යතාව පසක් කර ගත්හ.

ගෞතම බුදුහු අමිතාභ බුදුන් පිළිබඳ රහස සැරියුත් මුගලන් අගසව් දෙනමටත් මහාකාශ්‍යප රහතන් වහන්සේටත් ආනන්ද හිමියන්ටත් හෙළිකර සිටියහ. ඒ ඇසූ මුගලන් හිමි තම සෘද්ධි බලයෙන් අපගේ ලොවට පැමිණ බුදුන් දැක වැඳපුදාගෙන ගියහ. අමිතාභ බුදුන් පිළිබඳ රහස ගෞතම බුදුන් විසින් තුසිත දෙව්ලොව දී මාතෘ දිව්‍යරාජයා ප්‍රමුඛ දෙවියන් වෙත හෙළිකරමින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කළහ. සැරියුත් හිමියන් ප්‍රකෘති ශ්‍රාවකයන් වෙත සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරන්නට අවසර ඉල්ලූ කළ බුදුහු ඊට අවසර නොදුන්සේක".

"ශාරිපුත්‍රය මෙය සද්ධර්ම පුණ්ඩරීකය දේශනා කිරීමට කාලය නොවේ. ඉදිරි අනාගතයේදී සද්ධර්ම ප්‍රතිරූපක ගොඩනැගී බුද්ධ වචනය කුමක්ද යන්න නොපැහැදිලි වන කාලයක් පැමිණෙයි. එකල්හි අෑත සක්වල සිට පැමිණෙන බෝධිසත්වයෙක් මනුෂ්‍ය ලොවට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පිළිබඳ රහස හෙළි කරයි. එකල්හි පින් ඇති මනුෂ්‍යයෝ සද්ධර්ම පුණ්ඩරීක දේශනාව අසා මෙය මාර්ගයයි මෙය අමාර්ගයයි යන කරුණු දැක අමාර්ගය අතහැර නියම මාර්ගයෙහි ගොස් මාර්ගඵලයන්හි පිහිටති. දුශ්ශීල පිරිස ශාසනයෙන් නෙරපා දැමෙති. මේ ආකාරයට නැවත වරක් බුදුසසුන පිරිසිදු වෙයි''.

තවද ගෞතම බුදුන් එකී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මුල කොටස වන මාර්ග අමාර්ග විස්තරය හෙළිකිරීමට මා මිනිස් ලොවට කැඳවා අවස්ථාව දෙන ලදි. ලෝකධාතු පිළිබඳ විස්තරය හෙළිකිරීමට තවත් බෝධිසත්වයෙකු වෙත පවරන ලදි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පිළිබඳ රහස ප්‍රචාරණයට එකල මිනිස් බවෙහි සිටි ඔබ තෝරා ගන්නා ලදී.

වඩා මෑත කල්හි අමිතාභ බුදුහු අපගේ ලෝකතලයේ සිට තවත් සූත්‍රයක් හෙළිකළහ. ඔබ විසින් සද්ධර්ම පුණ්ඩරීකයේ රහස මෙලොවට හෙළිකරන බවද ඔබ මෙතේ බුදු සසුනෙහි අසූ මහා ශ්‍රාවක පිරිසට එක්ව ධර්මධරයන් අතර අග්‍රස්ථානයට පත්වන බවට ද එම සූත්‍රයේ සඳහන් වන අතර අසූමහා ශ්‍රාවක පිරිසට එක්වන ඔබගේ තවත් මිත්‍රයෙකු ගැන එහි විශේෂයෙන් සඳහන් වේ.

අමිතාභ බුදුන් පිළිබඳ රහස තුසිතයේ දෙව්යන්ට වදාළ බව දැන අසාගත් පරනිර්මිත වශවර්තියෙහි සිටින මාරදූත පිරිසක් බුදුදහම විනාශ කිරීමේ ඒකායන අරමුණ පෙරදැරිව ඔබගේ ලොව මිනිසුන්ගේ සිතට ඇතුළු වී අද පවතින බොහෝ මහායාන සූත්‍ර බිහි කළහ. මහායානය බිහිකළ භික්ෂූහු සංඝ භේද පාපකර්මය කරගත්හ. මහායානවාදීහු දෙවර්ගයක් සිටිති. බුදුවීමෙන්ම සසරදුක අවසන් වන බව සිතන එක් පිරිසක් බුදුබවම පතති. ඔවුන් ශ්‍රාවක බෝධිය පිළිනොගන්නා බැවින් ප්‍රකෘති ශ්‍රාවකයෙකු ලෙස නිවන් දැකීමේ වරම ඔවුන්ට අහිමිවෙයි. ශ්‍රාවක බෝධියක් නොපිළිගන්නා බැවින් ලොව්තුරු බුදු පදවියද ඔවුන්ට අහිමිය. එබැවින් ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ කාලසීමාව අවසානයේ පමණක් ඔවුන් පසේ බුදුබවට පත්වීමේ ඉඩක් ඇත. මහායාන භාවනා ක්‍රම සකස් වී ඇත්තේ වශවර්ති මාරයන්ගේ සිතැඟි අනුවය. ඒ භාවනා ක්‍රම වඩන පිරිස් මරණින් මතු පරනිර්මිත වශවර්තියේ ඉපිද මාරයාගේ යටත්වැසි මරසෙනඟ බවට පත්වෙති. මේ ආකාරයට මාරයාගේ උගුලට හසුවන පිරිස් නිසා මාර සෙනග බලවත් වෙති. තව තවත් තරවෙති.

ඔබ තුසිත දෙව් ලොව සිට රූපකාය එහි තබා මෙහි පැමිණයේය. ඔබ විසින් පෙරකල භාවිත කරන ලද වජ්‍රායුධයද චක්‍රරත්නායුධයද තුසිත දෙව් ලොවෙහි ඔබේ රූපකාය මත මෙතෙක් රැඳී පැවතුනි. වජ්‍රායුධය සුරතෙහි වු අතර චක්‍රරත්නායුධය ඒ අසල විය. ඔබගේ ඉල්ලීම පරිදි නාරොපා මුණිවරයා තුසිත දෙව්ලොවට ගොස් මාර තර්ජන වලින් ඔබ ගලවනු පිණිස වජ්‍රායුධය ඔබ වෙතට ද කග්ඩ නම් දිව්‍ය ආයුධය හා වාලධී නම් දිව්‍ය ආයුධය තවත් යෝගියෙකු වෙතට ද රැගෙන ආවේය. වජ්‍රායුධය ඔබ අතේ ලෙලදෙන විට ඉන් පැන නැගුණු රශ්මි ධාරා මා සිටින ලොවට දැනුනි. මා ඔබ සොයා මෙහි ආවේ ඉන් නැඟුනු සංඥාව පිළිබඳව විමසනු පිණිසය. ඈත ලොවක සිටින පද්ම ශ්‍රී බෝසතාණෝ මේ සංඥාව නිසාම ඔබ වෙතට පැමිණෙමින් සිටිති. මේ සියළු සිදුවීම් මේ ආකාරයෙන්ම සිදුවීමට නියමිතව තිබුණි.

පෘථිවි වාසීන් වන ඔබට කිසිදින කය හැරදා යහතින් නම් අප ලොවෙහි ඉපදිය නොහැක්කේමය. මන්දයත් ඔබගේ ලොව සිටින මිනිසුන් මේ සක්වලෙහි ඇතිදේම උපාදාන කරගෙන සිටින බැවිනි. කෙසේ නමුත් බරපතල පාපකර්ම කරන සමහර පිරිස් සක්වල දෙකක් අතර පිහිටි ලෝකාන්තරික නිරයෙහි ඉපදෙති. ඔවුන්ගේ පාපකර්ම ගෙවා අවසන් වන විට තමන් පැමිණි සක්වල වැනසී තිබුණහොත් ලෝකාන්තරික නිරයෙන් එහා සක්වල ඉපදීමේ අවස්ථාව ලැබේ. එනමුත් එතැන්හි ඉපදෙන්නේ අලුත් සත්වයෙකු ලෙසය. අලුතින් හටගන්නා කර්ම ඵල පමණක් ඒ සත්වයාට ඉතිරිවන අතර සංසාරික මතකයද ගිලිහී යයි. එබැවින් මෙලොව කිසිවෙකු අමිතාභ බුදුවරයා දැකීමේ රිසියෙන් විවිධ ප්‍රතිපත්ති පිරීමෙහි කිසිඳු වටිනාකමක් නැත. මේ සක්වලෙහි ඉපිද සිටින යම් අයෙකු නිවන් දැකිය යුත්තේද මේ සක්වල තුළමය. දැහැන් බලෙන් මනෝමය කයින් මිසක ප්‍රකෘති කයින් සක්වල අතර කාලතරණය කළ නොහැක්කේමය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙහි මට අයත් දේශනා කොටස මෙයින් නිමවන අතර ලෝකධාතු පිළිබඳ විස්තරය දේශනා කිරීම පද්ම ශ්‍රී බෝසතුන්ට භාර කරමි."

---

පද්ම ශ්‍රී හෙවත් පද්මසංබ දෙවන බණවර වෙනුවෙන් පැමිණියේය. තමා සමගම මෙලොවට පැමිණි වජ්‍රධර තුමා හිමාලය පෙදෙසට හැරී ගිය බව පද්මසංබ කියා සිටියේය. හෙතෙම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ දෙවන බණවාරය හෙවත් ලෝකධාතු පිළිබඳ කථාව මෙසේ ආරම්භ කළේය.

"මම පද්ම ශ්‍රී නම් වෙමි. ගෞතම බුදුන් මාහට පද්ම සංබ යනුවෙන්ද ඇමතීම් කළහ. මම සක්වල දහසයක් පසුකර මෙහි ආවෙමි. එනම්, මෙහි සිට දහහත්වන සක්වලෙහි ජීවත්වන බෝධිසත්වවරයෙක්මි.

මේ ලෝකධාතු දහහත තුළ දැනට බුදුවරයෙකු සිටින්නේ මංජු ශ්‍රී බෝධිසත්වයා සිටින ලොව තුළ පමණි. ඒ ලොව සුඛාවතී නම් වේ. සුඛාවතියෙහි සත්වයන්ට ඉතා දීර්ඝ ආයුෂ ඇත. අමිතාභ නම් වූ බුදුහු ඉතා දීර්ඝ කාලයක සිට එහි වැඩ වෙසෙති. සුඛාවතී ලෝක ධාතුව විනාශ වන තෙක්ම අමිතාභ බුදුවරයාණෝ එහි සිට අපමණ සත්වයන්ට සුවසෙත සලසති. මිනිස් ලොව ධ්‍යානලාභිහු කලාතුරකින් මනෝමය කයින් සුඛාවතියට පැමිණ අමිතාභ බුදුන් වැඳපුදාගෙන යති. දැනට ඔබේ ලොව ජීවත්වන මිනිසුන්ගෙන් සිව් දෙනෙකුට පමණක් ඒ වාසනාව පෙර කල උදාවිය. ඔබද ඔබගේ මිත්‍ර වූ යෝගියාද ඒ සිව්දෙනාට අයත් වෙති. ඔබ කෝණාගමණ බුදුන්ගේ කාලයේදී ධ්‍යාන වඩා මනෝමය කයින් පැමිණ ඒ අමිතාභ බුදුන් වැඳපුදා ගත්තෙහිය.

සුඛාවතියේ දිනක් ඉතා දිගු වන අතර නිතර ආහාර ගැනීමක් අවශ්‍ය නොවේ. මා දන්නා පරිදි ඔබ සිටින මේ ලොව ආයුෂ අඩුම මිනිසුන් වෙසෙන ලෝකතලයයි. අපගේ ආයුෂය සමග සසඳන විට මෛත්‍රී බුදුන්ගේ ආයුෂද බොහෝ කෙටිය. තවත් වර්ෂ නව කෝටි තිස් ලක්‍ෂයකින් පසු පහළ වන මෛත්‍රී බුදුන් පිරිනිවන් පා බොහෝ කල් ගතවනතෙක්ම අමිතාභ බුදුහු සුඛාවතියේ වැඩ වෙසෙති. එනමුත් ඔබගේ ලෝකයේ කිසිම කෙනෙක් අමිතාභ බුදුන් වෙත ගොස් නිවන් දැකීමට ප්‍රාර්ථනා නොකළ යුතුය. එය අභව්‍ය සිදුවිමකි. කිසිසේත්ම සිදුවිය නොහැක්කකි.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සෑම බුදුවරයෙකු විසින්ම දේශනා කරනු ලබන්නකි. වෙනත් ලෝක ධාතුවල සිටින සර්වඥයින් වහන්සේලා සහ බෝධිසත්වවරුන් පිළිබඳ විස්තර සම්පින්ඩනයක් සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයට ඇතුළත් වෙයි. ගෞතම බුදුහු තුසිත දෙව්ලොවට වැඩම කර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කිරීමට සැරසුනහ. එවිට තුසිත දෙව්ලොව වැසි බෝධිසත්වවරු බුදුන් වැඳ තම තමන් බුදුවන අනුපිළිවෙලට අනුව අසුන් ගත්හ. ගෞතම බුදුන්ගේ ආඥා ක්ෂේත්‍රයට ඇතුළත්වන දසදහසක් සක්වලවැසි බෝධිසත්වවරු තම සෘද්ධි බලයෙන් එතැනට වැඩම කළහ.

එකල්හි බුදුහු ශ්‍රී මුඛයෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කිරීම ඇරඹූහ. මිනිස් ලොව එකල සිටි සැරියුත්, මුගලන්, මහකසුප් හා ආනන්ද යන හිමිවරුන් සිව්නම පමණක් සද්ධර්ම පුණ්ඩරීකය දැරීමේ සුදුසුකම ඇති බව බුදුහු හෙළි කළහ. සුඛවතිය පිළිබඳ විස්තරයද අමිතාභ බුදුන් පිළිබඳ රහසද ඒ ඒ ලෝකධාතුවල ආයුෂ ප්‍රමාණ ආදියද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට ඇතුළත් විය. ඒ ඒ ලෝකධාතුවල පවත්නා වේගය අනුව එහි වැසියන්ගේ ආයුෂ ප්‍රමාණය තීරණය වේ. සුඛාවතියේ වේගය අවම බැවින් එහි වැසියෝ උපරිම ආයුෂට හිමිකම් කියති. පෘථිවි වැසියන්ගේ ආයුෂය අඩුවීමට හේතුව එහි ඇති අධික වේගයයි."

මේ අපූර්ව විස්තරය කරන අතරතුර පද්ම ශ්‍රී මඳ විරාමයක් ගත්තේය. වජ්‍රධරතුමා මංජු ශ්‍රී බෝසතාණන් සමග හිමාල ප්‍රදේශයේ සිටින බැවින් මා එහි යායුතුය. පසුවට නැවත එමි. සූත්‍රයේ ඉතිරි කොටස අද සවස දේශනා කරමි යනුවෙන් කී පද්ම ශ්‍රී හිමාලය දෙස බලා යන්නට ගියේය. චිත්ත සන්නිවේදන ක්‍රමය උපකාරයෙන් ඒ තිදෙනාම ඉක්මනින් ආපසු කැඳවීමට හැකිවිය.

මංජු ශ්‍රී, පද්ම ශ්‍රී සහ වජ්‍රධර යන තිදෙනා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉතිරි ධර්ම කරුණු පෙළගස්වන්නට වූහ.

"සුඛාවතී නම් ඒ ලෝකයේ කාන්තාවන් නොමැත. දිවා රෑ වෙනසක් එහි නොමැත. එහි වෙසෙන සියළු මනුෂ්‍යයෝ පුරුෂ රූපකායෙන් යුතුව සිටිති. ඔවුන් ඉතා පැහැපත් වන අතර ස්ත්‍රී පුරුෂ ඇසුර නොමැතිකම ද ඔවුන්ට දීර්ඝායුෂ හිමිවීමට හේතු වී ඇත. තවද එහි වෙසෙන සත්වයන්ට පවා කථා කළ හැකිවීම ආශ්චර්යයකි.

ගෞතම බුදුන්ගේ ආඥා ක්ෂේත්‍රය දසදහසක් සක්වල පැතිර පවතින්නේය. මහබෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම, මහබෝසත් උපත, බුද්ධත්වයට පත්වීම යන අවස්ථා තුනෙහිදීම දසදහසක් ලෝකධාතු පුරා ආලෝකයක් විහිදුනි. දසදහසක් සක්වලෙහි සිටින පංචඅභිඥා ලද්දෝ

කවරනම් හෝ ලෝකධාතුවක බුද්ධෝත්පාද කාලයක් ඇරඹුණු බව එයින් දැනගත්හ.

තුසිත දෙව්ලොව සිට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර දේශනාව අවසන් කළ ගෞතම බුදුහු මෙසේද වදාළහ. දැන්ම මේ කරුණු මනුෂයයන් අතර ප්‍රසිද්ධ වීම අවශ්‍ය නොවේ. වසර දෙදහස් පන්සියයක් එපිටදී සිදුවන ශාසන පරිහානිය වැළැක්වීමට අවශ්‍ය හෙයින් බෝසත්වරු ඉදිරිපත්ව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මිනිසුන් වෙත බෙදා හරිති. තවද ඒ සිදුවීම ඇරඹෙනුයේ ජම්බුද්වීපයට එපිටෙනි."

මංජු ශ්‍රී බෝසතාණෝ මෙසේද කීහ. "පින්වත තව මාස හතරක්වත් ඉවසා සිටින්න. මෙලොව සිටින බොහෝ දෙනෙක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දැරීමට තරම් නුවණින් මුහුකුරා ගොස් නැත. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට නිගරු කරන අය අපායට නියම වෙති. එළිපිට ඊට ගරහන අය අකුණු සැර ආදී අනතුරුවලට ලක්ව මියගොස් අපායේ උපදිති. සද්ධර්ම පුණ්ඩරීකය සමාදන්වන අය මරණින් මතු සුගතියෙහි උපදිති."

මංජු ශ්‍රී බෝසතාණෝ මෙසේ ද කීහ. "ශ්‍රී සද්ධර්මය ත්‍රිවිධ යානයකි. සම්මාසම්බුද්ධ යානය, පච්චේක බුද්ධ යානය සහ ශ්‍රාවක යානය ත්‍රිවිධ යානයන් නම්වේ. මෙකී ත්‍රිවිධ යානයෙන්ම සසර දුක කෙළවර කරගත හැකිය. ඒ ඒ යානයෙන් සසර දුක කෙළවර කිරීමට නම් ඊට අදාල ප්‍රතිපදාව සම්පූර්ණ කර තිබිය යුතුය. පෙර පින්කළ බව, උනන්දුව හා කැපවීම ඇති අයට පමණක් සත්‍යාවබෝධය කළ හැකිය.

තමා අතීතයේ කෙසේ ශාසනික ප්‍රතිපදාව පුරන ලද්දේද යන්න තම තමන් විසින් සොයා ගැනීම වැදගත්ය. කුශලය හුරු කිරීම අවශ්‍යය. නිවනම ඉලක්ක කර ගතයුතුය. සසරෙන් එතෙර වීම ඔබගේ අභිප්‍රාය විය යුතුය. පංචාභිංඥා උපදවා ගැනීමට වෙර දරන්න. පංචාභිංඥාවන් දෙවැනි වනුයේ බුදුවරයෙකු සතු සර්වඥතා ඥානයට පමණි."

ඊළඟට පද්ම ශ්‍රී බෝසතාණෝ ලෝකධාතු පිළිබඳ විස්තරය සම්පූර්ණ කිරීම සඳහා තවත් කරුණු කිහිපයක් හෙළිදරව් කළහ.

"පද්ම ශ්‍රී වන මා වෙසෙන ලෝකයේ පාලනය ගෙන යනුයේ සභාගති නම් වූ සක්විති රජෙකු විසිනි. පද්ම ශ්‍රී වන මා වෙසෙන ලොව ආයුෂ සුඛාවතියේ ආයුෂයට වඩා අඩු වේ. එහි පුරුෂයෝද කාන්තාවෝද සිටිති. මතු උපදින මෙතේ බුදුන්ගේ ආඥා ක්ෂේත්‍රයට ලෝකධාතු හැටකෝටියක් විෂය වනු ඇත. එක් ලෝක ධාතුවක වරෙකට පහළවනුයේ එක් බුදුවරයෙකු පමණි. සක්විති රජෙකු පහළ වී සිටින ලෝකධාතුවක බුදුවරයෙකු පහළ නොවේ. මාගේ දැනුමට විෂය වන පරිදි පිරිමි මනුෂ්‍යයන් පමණක් සිටින ලෝක ධාතු හතක් වෙයි. ඒවායේද ආයුෂ ඉතා දීර්ඝය. රැයක් හෝ දවාලක් කියා විශේෂයක් ද නැත.

ඊළඟට බෝසත්වරු තිදෙන මෙසේද කීහ. අපි අද රුවන්මැලිසෑය වැඳපුදා ගත්තෙමු. මේ කල්පයෙහි බුදු වූ හැම බුදුවරයෙකුගේම ධාතු නිධන් කළ ස්ථාන හරියටම එතැන පිහිටා ඇත. රුවන්මැලි සෑය පිහිටි තැන ඒක ඝන ධාතුන්වහන්සේලා තුන්නමක් වෙති. එනම් බුදුවරුන් තිදෙනෙකුගේ කැඩිබිඳී විසිරී නොගිය ධාතූන් වහන්සේලා එතැන ඇත."

මේ ආකාරයට අතුරු කථාවක්ද කී බෝධිසත්වවරු තිදෙන සතුටින් නික්ම ගියහ.

දේශනාව අවසානයේ බෝසත්වරුන් තිදෙන නික්ම ගිය පසු වජ්‍රයෝගිනී නම් තැනැත්තිය පැමිණියාය. "අකනිටා බඹලොවට එහා සක්වල තරණයට යොදාගන්නා වාලහීමුඛයක් පවතියි. පද්ම ශ්‍රී ඔබ හමුවට එන අතර අපගේ ලෝකයට සංඥාවක් යවා මාද මෙහි කැඳවීය. මා වෙසෙන ලොව ඔබ වෙසෙන පෘථිවියට ආසන්නතම සක්වලෙහි පිහිටා ඇත. හරියටම කියතොත් ධනු රාශියෙහි අප සිටින ලොව පිහිටා ඇත. අපගේ ලෝකය එහි ඇති සූර්යයාගෙන් බොහෝ දුරස්ව පිහිටයි. මාගේ

ආයුෂය වසර දස දහසකි. අප වෙසෙන ලෝකය සාග නම් වෙයි. සාග නම් ලෝ තලය වනස්පති වෘක්ෂ රාජයන්ගෙන් ගහණව පවතින්නේය. ඒ ලෝකයේ ඇත්තේ ඉතා සෞම්‍ය කාලගුණයකි. සාග ලෝකයෙහි සූර්යයන් දෙදෙනෙකි. කත්‍රික නම් සක්විති රජෙක් එහි රජකම් කරයි. මම ඒ සක්විති රජුගේ අගමෙහෙසිය වෙමි. ධ්‍යාන වඩා අෂ්ඨසමාපත්ති උපදවා සක්වල තරණයේ හැකියාව ලැබීමි. සාග ලෝකයේ සක්විති රජුට බොහෝ දක්ෂතා ඇති පුත්තු දහසය දෙනෙක් වෙති. ඉන් එකෙකුට වර්ෂාව වැස්සවිය හැක්කේය. මේ පුත්තු ඔවුන්ගේ අපූරු හැකියා සියල්ල උපතින්ම ගෙන ආහ. ඉන් එක පුත්‍රයෙක් කම්මැලියෙකි. නමුත් ඔහු බෝධිසත්වයෙකි. ඒ කම්මැලි බෝධිසත්වයාට දැඩි අධිෂ්ඨාන බලයක් ඇත. සාග ලෝකය හා සම්බන්ධ දිව්‍යතල දහහතරකි. ඒ දිව්‍ය තල පෘථිවියේ දිව්‍යතල මෙන් දෙවියන්ගෙන් පිරී ඉතිරී ගොස් නැත. සුළුතර දිව්‍ය පිරිසක් එහි වෙති.

මිනිස් ලෝකයේ විසූ විවිධාකාර ඍෂිවරු කලින් කල අප සමග සබඳතා පැවැත්වූහ. මිනිසුන් දන්නා බොහෝ ශාස්ත්‍රවිධි අප විසින් පෘථිවියට පැමිණ පුරුදු පුහුණු කරන ලද ඒවාය. පෙර බුදුවරයෙකු සමයෙහි අපගේ ලොවෙහි අය මෙහි පැමිණ බෝධිසත්වවරයෙකුට කුණ්ඩලනී යෝග රහස් උගන්වන ලද්දේය. ඒ බෝධිසත්වවරයා ගෞතම නමින් මෑතකදී බුදුබව ලැබ පිරිනිවන් පෑවේය. අදටද ඔබගේ ලොවෙහි පවත්නා කුණ්ඩලනි යෝග විද්‍යාව ඒ බෝධිසත්වවරයා විසින් පෙරකළ පුරුදු පුහුණු කරවන ලද්දකි. අප විසින් පෘථිවිවාසින්ට කියා දුන් බොහෝ ශාස්ත්‍රවිධි දැන් මිනිසුන් අතරින් ගිලිහී ගොස් ඇත. තෙරපීමෙන් රෝග සුවකිරීමේ විධිය එවැන්නකි. දැනට අවුරුදු විසි අටදහස් හයසීයකට උඩදී රාවණා නම් රජෙක් ලංකාවෙහි වාසය කළේය. ඔහු අපගේ ලොවත් සමග සබඳතා පවත්වා බොහෝ දේ උගත්තේය. තවද රාවණා විසූ ලංකාද්වීපය පෙර කල ඉන්දියාවෙහිම කොටසකි. පෙර බුදුවරුන්ගේ ධාතු **ලංකාවෙහි තැන්පත්** කරන ලද්දේ ලංකාව ඉන්දියානු භූමියෙහිම **කොටසක්ව** තිබියදිය. ප්‍රබල භූමිකම්පාවකින් ලංකාව ඉන්දියාවෙන් වෙන් වූ අතර එය හෙමිහිට දකුණු දෙසට තල්ලු වී ගියේය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැනද මවිසින් යමක් කිව යුතුය. මෛත්‍රී බුද්ධ ශාසනයේ මුලින්ම කියවෙන සූත්‍ර අතර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයද වෙයි. එකල වෙසෙන මිනිසුන්ට බොහෝ ආයුෂ ඇති බැවින් ඔවුහු ධ්‍යාන වඩා අමිතාභ බුදුන්ගේ භූමියට මනෝමය කයින් ගොස් එහි ඇති දේ දැකබලා සැකහැර දැනගනිති. ඔවුහු සුඛාවතිය සමග ඍජුව ගනුදෙනු පවත්වති. එබැවින් මේ රහස් කලින්ම හෙලිවීමෙන් අනතුරක් හට නොගනියි.

බුද්ධ ශූන්‍ය කාලවල පසේබුදු බව ලබන උතුමෝ දුර සක්වල ඇති බුද්ධ භූමි හා මානසික සබඳතා ඇතිකරගෙන සත්‍යාවබෝධය ලබති.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රසිද්ධ කිරීමට පෙර නුවණැති කිහිප දෙනෙකුට එය දේශනා කරන්න. ඔවුන් එහි අගය වටහා ගනු ඇත. තවත් මාස හතරක් ගතවන විට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය වාතාවරණය ගොඩනැගෙනු ඇත. මමද වජ්‍රධරතුමා, පද්ම ශ්‍රී තුමා සහ මංජු ශ්‍රී තුමා සමග දැන් හිමාලය දෙසට යමි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර දේශනාවෙන් පසු මෙතෙක් විසිරී තිබූ බුද්ධ ශාසනය නැවත එක්තැන්වීම ඇරඹෙන්නේය. තවත් මාස හතරකින් මම ඔබගේ ලොව වෙත නැවත පැමිණෙමි. එතෙක් මට සමුදෙන්න."

මෙසේ කී වජ්‍ර යෝගිනිය බෝධිසත්වවරුන් සමග හිමාලය දෙසට ගමන් කළාය.

---

බෝසත්වරුන්ගෙන් වැදගත් කරුණක් අසා ගැනීමට අමතක විය. ඒ වජ්‍රසත්වතුමා කොහිසිට පැමිණියේද යන්නයි. බෝධිසත්වවරු තිදෙනද වජ්‍රයෝගිනියද නැවත වතාවක් මාගේ ඇරයුම මත පැමිණියහ. මංජු ශ්‍රී බෝසතාණෝ පළමුව දේශනාව ආරම්භ කළහ.

"වජ්‍රසත්වතුමා මෙහි පැමිණ සිටින්නේ විමලා නම් සක්වල සිටය. ඔබ සිටින පෘථිවිය සර්වාවතී සක්වල නම්වෙයි. සර්වාවතියට එපිටින් ඇති තුන්වන ලෝකධාතුව විමලා නම්වේ.

ඔබ වෙසෙන සර්වාවති ලෝකධාතුවෙහි මනුෂ්‍යයන්ගේ ආයුෂ වසර ලක්‍ෂයක උපරිමය කරා ළඟා විය හැක්කේය. කල්ප විනාශයෙන් පසුව ලෝක ධාතු නැවත බිහිවන කල මේ අගය සියක් ගුණයක් දක්වා වැඩි වී පරමායුෂ වසර කෝටියක් දක්වා ඉහළ නගින අවස්ථා ද ඇත.

ඔබ මෙතෙක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර දේශනාව අසා සිටියෙහිය. සද්ධර්ම පුණ්ඩරීක යන නාමයේ තේරුම ඔබ දන්නේද? මම එය ඔබට පහදා දෙන්නෙමි.

අපිරිසිදු ජලාශයක පතුලෙන් මතුවන නෙළුම් පොහොට්ටුව කළල් මුසු දියෙන් එසවී පිපී සුවඳ දෙන්නාක් මෙන් සංසාර සයුරෙහි උපන් පුද්ගලයෙකු පාරමීදම් පුරමින් සත්‍යාවබෝධය වෙනුවෙන් හැඩගැසිය යුතු ආකාරය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙන් විස්තර කරදෙයි. තවද බුදු පසේබුදු මහ රහත් යන ත්‍රිවිධ බෝධියට යායුතු මාර්ගය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුළින් උගත හැක්කේය.

මහායානිකයන් යැයි කියාගන්නා ඔබගේ ලෝකයට අයත් ඇතැම් පිරිස් මාර බලයට හසුව බොරු පොරොන්දු දී මිනිසුන් මුළා කර නොමග යවති. දැනට ඔබගේ ලෝකයේ ප්‍රචලිත මහායානයෙහි ප්‍රධාන දෝෂයන් පහක්ද අප්‍රධාන දෝෂයන් තුනක්ද වෙයි.

බුද්ධත්වයෙන් පමණක් සසර කෙළවරවේ යන්න මහායානිකයන් කියන පළමු බොරුවයි.

අමිතාභ බුදුන්ගේ නම ගුණ සිහිකරමින් සිට මිය පරලොව යාමෙන් සුඛාවතියේ ඉපදිය හැකිය යන ඉගැන්වීම මහායානිකයන්ගේ දෙවන

බොරුවයි. සක්වල දෙකක් අතර සත්වයන් මාරු වී ඉපදීම විරල සංසිද්ධියකි. කල්ප විනාශය එළඹෙන කල්හි බොහෝ පිරිස් ධ්‍යාන වඩා බ්‍රහ්මතලවල උපදිති. එලෙස ඉපදීමට නොහැකි වූ අයද සමග මනුෂ්‍යයන් හා තිරිසනුන් වෙසෙන තලය පළමුව විනාශවේ. මනුෂ්‍ය තලවල සිටින අය කල්පවිනාශයේදී බ්‍රහ්ම ලෝකයට යාගත නොහැකි වුවහොත් අපායෙහි උපදිති. කල්ප විනාශය උත්සන්නවෙද්දී අනුක්‍රමයෙන් අපාය භූමිද විනාශ වේ. විනාශවන අපායභූමි වල සිටින සත්වයෝ ලෝකාන්තරික නිරයෙහි උත්පත්තිය ලබති. ඔවුන්ගේ පව් ගෙවා නිම වූ කළ ලෝකාන්තරික නිරයෙන් නිදහස් වෙති. එලෙස ලෝකාන්තරික නිරයෙන් නිදහස ලබන කල ඔවුන් පැමිණි සක්වල නැවත බිහි වී නොතිබුණොත් ඒ සත්වයෝ ආසන්න සක්වලෙහි උපදිති. එය සක්වල අතර උත්පත්තීන් මාරුවන ක්‍රමයයි. එබැවින් සුඛාවතියෙහි වෙසෙන අමිතාභ බුදුන් වෙත ඉපදීමට ප්‍රතිපත්ති පිරීම නිරර්ථක ක්‍රියාවකි.

තවද මහායානිකයන්ගේ තුන්වන බොරුව නම් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය බුදුදහමේ ප්‍රමුඛතම සූත්‍රය ය යන කියමනයි. බුදුදහමේ ප්‍රමුඛතම සූත්‍ර හෙවත් මධ්‍ය දේශනා වනුයේ මහා සතිපට්ඨාන සූත්‍රය සහ පටිච්ච සමුප්පාදයයි.

තවද මහායානිකයෝ දානයට පමණක් තැනදී ශීල භාවනා ක්‍රම අමතක කරති. දාන, ශීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවෝ පාරමිතා පූරණයට ආධාරක වෙති.

තවද ස්ත්‍රීන්ට අධිගමයකට පැමිණිය නොහැකිය යන මහායාන මතවාදයද සම්පූර්ණයෙන්ම වැරදිය.

මහායානිකයන්ගේ අප්‍රධාන වැරදි තුන මෙසේය.

දශ පාරමිතාව ෂඩ් පාරමිතාවක් බවට ලඝු කර දැක්වීම පළමු අප්‍රධාන වරදයි.

සද්ධර්ම පුණ්ඩරීකය මතක තබාගැනීම පමණක් බුද්ධත්වයට ප්‍රමාණවත් වේ යන ඉගැන්වීම දෙවන අප්‍රධාන වරදයි.

බුද්ධත්වයට පැමිණි ස්ත්‍රීන් හෙවත් බුදුවරියන් සිටීය යනුවෙන් කීම තෙවන අප්‍රධාන වරදයි.

ගෞතම බුදුන්ගේ කාලයේදී ඔබගේ ලෝකධාතුවේ සිදු වූ දෙයක් දැන් මම විස්තර කරමි. පද්ම ශ්‍රී, මංජු ශ්‍රී, වජ්‍රසත්ව හා වජ්‍රයෝගිනී යන අපි සිව්දෙනාම ගෞතම බුදුන්වහන්සේගේ කැඳවීම මත දඹදිවට පැමිණියෙමු."

මාගෙන් අවසරයක් ලැබෙන තෙක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය කිසිදු මනුෂ්‍යයෙකුට හෙළි නොකරන බවට ඔබ සිව්දෙන මා හා ගිවිසගෙන ඇති බව සැබෑය. නිගන්ඨනාථපුත්තගේ මුල් පෙළේ අනුගාමිකයෙකු වන සුදත්ත ගුරුවරයා මාගෙන් සද්ධර්මය අසා මා කෙරෙහි පැහැදී අද මෙතැන සිටියි. ඔහු බුද්ධ ශාසනය ඉදිරියේ ව්‍යසන වලින් ආරක්ෂා කර දීමට මා හා ගිවිසගෙන සිටියි. ඉදිරි අනාගතයේදී සම්බුද්ධ ධර්මය සද්ධර්ම ප්‍රතිරූපකවලින් කිළිටිව. ශාසනය අතුරුදන්වීමේ අනතුරක් උදාවේ. සුදත්ත එකල්හි තුසිත දෙව්ලොවෙන් චුතව මිනිස් ලොවෙහි උපදියි. තව එක් දේවතාවෙක් ඔහුට ආරක්ෂාව පිණිස දෙව්ලොවෙන් චුතව මිනිසත් බවට පැමිණෙයි. සුදත්තට අතීතස්මරණ ඥානය පහළවී මා සමග ගිවිසගත් කරුණු මතක් වී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සොයනු ඇත. ඔබ සිව් දෙනාම එකල්හි මිනිස් ලොවට පැමිණ ඔහුට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරන්න. තවද මෙලොව යම් කිසිවෙක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රචාරය කරයි නම් ඔහු අධිමෝක්ෂය ලැබීමට සුදුස්සෙකු වනු ඇත. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අවබෝධයෙන් මාර්ගඵල ලැබෙයි. තවද මේ සූත්‍රය සමාදන්වීමෙන් සතර අපාය ඔහු කෙරෙන් දුරුවේ. තවද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අවබෝධ කරන අය මතු ඕපපාතිකව උපදිති. එයද ආශ්චර්යයකි."

"තවද ගෞතම බුදුහු ලෝකධාතූන්ගේ අපරිමිත ස්වභාවය ගැන මෙසේ දේශනා කළහ."

"යම් සෘද්ධිමත් මිනිසෙක් මුළු පෘථිවිය අඹ ඇට තරම් කැබලි වලට කඩා එක් කැබැල්ලක් පෘථිවිය ඇති තැන තබන්නේ යැයි සිතන්න. ඊළඟ කැබැල්ල තවත් ලෝකධාතු දහසකට එහා තබන්නේ යැයි සිතන්න. අඹඇට තරමේ කැබලි අවසන් වුවද ලෝකධාතූන්ගේ නිමක් නැත්තේය. මෙලෙස දසදිශාවටම අනන්ත අපරිමාන ලෝක ධාතු ප්‍රමාණයක් අවකාශයෙහි විසිරී පැතිරී පවත්නේය."

"තවද ගෞතම බුදුන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මිනිසුන් අතර ප්‍රචාරය කිරීමට පවරන ලද අවස්ථාවේදී සුදත්ත වරයක් ඉල්ලීය."

"සද්ධර්මය පිළිබඳ සැකයක් මට පැන නැඟුනු විට ඒ සැකය වහා සන්සිඳවිය යුතුය.

අභිමත පිරිසක් ප්‍රමාණකොට අධිෂ්ඨාන කොට විරුද්ධත්වයක් පැන නොනැගී සද්ධර්මය ප්‍රකාශ කිරීමට මට හැකියාව ලැබිය යුතුය.

ධර්මයේ හැසිරෙන්නන් පිළිබඳ විනිශ්චය දීමේ හැකියාව මා වෙත පහළවිය යුතුය.

කැමති අවස්ථාවක මනුෂ්‍ය සිරුරක් වෙත පැමිණ ඕපපාතිකව ඇතුළු වීමට ද කැමති අවස්ථාවක සිරුර හැරදා යෑමටද හැකියාව මා වෙත පහළවිය යුතුය.

ධර්ම ප්‍රචාර කටයුත්තේදී මා හට අවශ්‍ය පිරිවර හැමවිටම ලැබිය යුත්තේය."

සුදත්තයෙනි ඒ වර පස ඔබට ලැබේය යනුවෙන් ගෞතම බුදුහු වදාළහ.

ගෞතම බුදුන් හමුවීම ගැන දේශනා කළ බෝසත් පිරිස මෙසේ කීහ.

"පාරමිතා සම්පූර්ණවීම සතර සතිපට්ඨානය වැඩීම පටිච්චසමුප්පාදය අවබෝධය යන කරුණු සත්‍යාවබෝධයට අත්‍යාවශ්‍යය."

දේශනාව අවසාන කිරීමට මත්තෙන් පද්ම ශ්‍රී තවත් වැදගත් කරුණක් හෙළිකළේය. "පාරමිතා සම්බන්ධ වැදගත් සිදුවීම් දෙකක් වෙයි. යමෙකු පාරමිතාවන් සම්පූර්ණකර තිබියදී ප්‍රාර්ථනා කළ බෝධිය මගහැරියාම විරල සිද්ධියකි. තවද පාරමිතා සම්පූර්ණ නොකළ කෙනෙකු උත්සාහ දරා අධිගමයකට පත්වීම ද විරල සිද්ධියකි. මේ කරුණු දෙක විරල සිද්ධීන් නොවී නම් කිසි කලෙක කිසිම බුදුවරයෙකුට තවත් අයෙකු මතු බුදුවන බවට නියත විවරණ දීමේ හැකියාවක් නොලැබෙනු ඇත."

මංජු ශ්‍රී නැගෙනහිර දෙසින් පැමිණ සිටි අතර ඔහුට පාටිවියට ඒමට දින දෙකක් ගතවිය. පද්ම ශ්‍රී බටහිර දිගින් පැමිණි අතර ඔහුට පෘථිවියට ඒමට දින හතරක් ගතවිය. වජ්‍රධරතුමා සහ වජ්‍රයෝගිනිය උඩ දිශාවෙන් සූර්යයා ඉලක්කයේ තබාගෙන පැමිණි අයයි. වජ්‍රධරතුමාට දිනක් ද වජ්‍ර යෝගිනියට පැය දහයක්ද සක්වල තරණයට වැයවිය. දේශනාව අවසානයේ ඔවුහු තමතමන්ගේ සක්වල වෙත ගියහ.

# අක්ෂෝභය තන්ත්‍රය

සර්වාවති සක්වල නම්වූ අප වෙසෙන ලෝකධාතුව ආසන්නයෙහි සාග නම් ලෝකධාතුවක් වෙයි. සාග නම් ලෝකය විවිධාකාර වෘක්ෂලතා වලින් හැම විටම අලංකාරව පවතී. සාග නම් ලෝකධාතුවෙහි මනරම් කඳුවළල්ලකින් වටවූ සම්පා නම් විලක් වෙයි. සිව්දිගින් ගලාබසින්නා වූ මහා ගංගාවන්ගේ පහසලත් සම්පාවිලෙහි ජලය සුපිරිසිදුව අඩු නොවී පවතින්නේය.

සාග නම් ලෝකධාතුවේ පාලකයා කත්‍රික නම් වූ චක්‍රවර්ති රජෙකි. ඔහුගේ අගමෙහෙසිය වූ වජ්‍රයෝගිනිය අෂ්ඨසමාපත්ති උපදවා ගැනීමට සමත්ව සිටියි. කත්‍රික රජුට මහා බලසම්පන්න පුත්තු දහසය දෙනෙක් වෙති. ඉන්වැඩිමලා අක්ෂෝභය නම් වෙයි. අක්ෂෝභය කුමරු අධිෂ්ඨාන බලයෙන් අගතැන්පත්ව සිටියි. හෙතෙම බෝධිසත්වවරයෙකි. සැපසම්පත් නොඅඩුව භුක්තිවිඳිමින් අලසව කල්ගෙවන නිසාම ඔහුට කම්මැලි බෝධිසත්වයා යන අන්වර්ථ නාමය යෙදී ඇත.

මංජු ශ්‍රී, පද්ම ශ්‍රී, වජ්‍රසත්ව, වජ්‍රයෝගිනි යන සිව් දෙනා පිටසක්වල සිට මනුෂ්‍ය ලෝකයට පැමිණ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ තම තමන්ට භාර කොටස් කියා දී ආපසු යන්නට ගියහ. ඉන් දෙදිනකට පසු සන්ධ්‍යාවෙහි දෙවියකුද නොවූ මනුෂ්‍යයෙකුද නොවූ මේ සක්වලවාසී වෛරෝචන මා ඉදිරිපිටට පැමිණියේය.

"මම වෛරෝචන නම් වෙමි. ඔබ වෙසෙන සක්වලෙහිම වාසය කරමි. බෝධිසත්ව පිරිසක් මිනිස් ලොවට පැමිණ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කළ බවට රාවයක් ආභස්සර බ්‍රහ්මලෝකය දක්වා පැතිර ගොස් ඇත. එය අසා ප්‍රීතියට පත්ව ඔබ හමුවට පැමිණියෙමි. බලයෙන් හා තේජසින් වෙසමුණි රජුට දෙවැනි වන මම උපාය ශක්තියෙන් අගතැන්පත්ව සිටිමි. කර්මශක්ති ප්‍රහානය ඇතුළු අසුර ප්‍රයෝගයන්ගෙන් සන්නද්ධව සිටිමි. උපදෙස් අවශ්‍ය වනවිට මා අමතනු මැනවි. එතෙක් මාගේ වාසභවනයට යමි."

මෙසේ කී වෛරෝචන තෙමේ සක්වල ගල නම්වූ අඳුරු වලා පටලය කෙළවරවූ ස්වකීය අසුර භවනය වෙත ගොස් සමාධි නිද්‍රාවට එළඹියේය.

වෛරෝචනගේ ආගමනයට පසු දින අළුයම් කාලයෙහි මහත් තේජසක් සහිත ආලෝක කදම්භයක් මෙලොවට පතිත විය. එය දුරස්ථ සක්වලක වෙසෙන අමිතාභ බුදුන් මහා කරුණා සමාපත්තියෙන් නැගී සිට ලොව බලන වේලාවයි. අමිතාභ බුදුන්ගේ මනහර රූපස්කන්ධය මා ඉදිරිපිටදී ඇඳී ගියේය.

"පින්වත, මහා කරුණා සමාපත්තියෙන් නැගී සිට ලොව බලමි. ඉදිරියේදී පෘථිවි වාසීන් ගොදුරුවන අන්තරායක් දැක ඔබ අමතමි. මෙකල ඔබගේ ලෝකධාතුවෙහි සිටින අය අමිතාභ නම්වන මා වෙත පැමිණෙනු රිසිව නොයෙක් පුද පූජා සහ ප්‍රතිපත්තීන්හි යෙදෙති. ඒ සියළු පූජා හා ප්‍රතිපත්තීන් නිෂ්ඵලය. නිරර්ථක ය. ඔබගේ ලොවෙහි කිසිවෙකුට මා වෙසෙන සුඛාවතියේ ඉපදීමට අවස්ථාවක් නොලැබෙන්නේමය. ඉතින් මේ නොලැබෙන සම්පත ප්‍රාර්ථනා කරන ඔවුහු ගෞතම බුදුන්වහන්සේගේ ශ්‍රී සද්ධර්මය අමතක කර දමති. අත්හැර දමති. එයින්ම සද්ධර්ම අන්තර්ධානයට වැඩ සැලැස්වෙන්නේය.

තවද ඔබ විසින් අසන ලද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මිනිසුන්ට දුරවබෝධයැයි සිතමින් ඔබ දුක්වන්නේය. තැවෙන්නේය. උකටලීව සිටින්නේය. එසේ නොසිතව. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තේරුම් ගතහැකි පිරිස් ඔබගේ ලොවෙහි එකෙක් දෙන්නෙක් නොව ශත සහස්‍ර ගණනකින් සිටිති. ඔබ විසින් හෙළිදරව්කර මාස තුනක් ගතවත්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට මිනිසුන් අතර පිළිගැනීම හිමිවේ. එයින්ම දෙබෑවූ ශාසනය එක් වීමේ ක්‍රියාදාමය ඇරඹෙන්නේය."

තවද සවස්යාමයෙහි අමිතාභ බුදුහු මංජු ශ්‍රී බෝසතානන්ද තවත් දෙදෙනෙකුද සමග ධර්ම සාකච්ඡාවක නිරත වූහ. අපගේ ආරාධනය පරිදි අමිතාභ බුදුහු නැවත මෙලොව වාසීන් ඇමතීම ආරම්භ කළහ.

"පින්වත් මිනිසුනි, ඔබගේ ලොවෙහි සම්බුද්ධ ශාසනය පිරිහෙනුනේ මිනිසුන් බෝධිසත්ව චර්යාව සමාදන් වීම නිසා නොවේ. අමිතාභ නම් වූ මා වෙත පැමිණීමේ නිරර්ථක ක්‍රියාදාමයට අවතීර්ණ වීම තුළිනි. "

එය අමිතාභ බුදුන්ගේ දෙවැනි දේශනයේ සාරාංශගත අර්ථයයි. අමිතාභ බුදුන්ගේ දම්දෙසුමෙන් පසුදින මධ්‍යාහ්න වේලාවේදී අක්ෂෝභය කුමාරයා පෘථිවියට පැමිණ සිටියේය. "මම අක්ෂෝභය නම් වෙමි. මාගේ මෑණියන් වන වජ්‍රයෝගිනියගේ උපදෙස් මත මෙහි පැමිණියෙමි." "පින්වත් අක්ෂෝභය කුමාරයාණෙනි, මිනිස් වර්ගයාගේ යහපත පිණිස යමක් දේශනා කරනු මැන" යනුවෙන් මම ඔහුට ආරාධනා කළෙමි.

"සැම විටම බෝධිසත්ව චර්යාවෙහි යෙදෙන්න. එනම්, පරෝපකාරයෙහි නිරත වන්න. ගිහියන්ට ලෞකික සැපත තහනම් නැත. එනමුත් කාමස්වාදයේ පමණ දැනගත යුතුය. සීමාව දැනගත යුතුය. එය ගිහි බෞද්ධ ප්‍රතිපදාවයි."

අක්ෂෝභය කුමරා සවස් කාලයෙහි ලෝක ධාතු අතර දැනුම සංසරණය වන අයුරු පහදා දුන්හ. "එක් සක්වලක් විනාශවන කාලයෙහි අනෙක් ආසන්න සක්වල බොහෝ විට නොනැසී පවතියි. නැසුන සක්වල යළි නිර්මාණය වූ කල්හි අනෙක් සක්වල වැසි අභිඥාලාභීහු මනෝමය කයින් ආසන්න සක්වලට පැමිණ එහි සිටින පින්වත් මනුෂ්‍යයන්ට විවිධාකාර විද්‍යාවන් උගන්වති. මේ ආකාරයෙන් සක්වලක් නැසුනද විශ්ව දැනුම නොනැසී පවතින්නේය.

මේ භද්‍රකල්පය තුළ ඔබගේ ලෝකධාතුවෙහි පවත්නා විවිධ විද්‍යාවන් රාශියක් අපගේ ලෝකධාතුවෙන් පැමිණි අය විසින් හඳුන්වාදෙන ලද දේය. කුණ්ඩලනී යෝග විද්‍යාව ද ආයුර්වේදයද, නක්ෂත්‍රයද පෙර කල තිබූ ශුද්ධ මාගධී භාෂාවද අපගේ පරිත්‍යාගයන්මය. පෙර පදුමුත්තර බුදුන් වැඩවසන කල්හි අපගේ ලෝකධාතුව තුළ කුණ්ඩලනි යෝග විද්‍යාව

නොපැවතුනි. ඔබ හා ඔබේ මිත්‍ර යෝගියා මනෝමය කයින් අප වෙත පැමිණ ඒ ශාස්ත්‍රය අප වෙත දෙන ලද්දේය. අපගේ ලෝකවාසීන් ඔබ දෙදෙනා වෙත විශේෂ ඇල්මක් දැක්වීමට එය හේතු විය."

එසේ කී අක්ෂෝභය කුමරු ධාතු වන්දනාව පිණිස අනුරපුර බලා ගියේය. නැවත රාත්‍රී කාලයේ පැමිණි ඔහු තමාදුටු අපූර්ව දෙයක් හෙළිදරව් කළේය.

අනුරපුර ජේතවනාරාමය හරි පුදුම තැනකි. පුරාණ චෛත්‍යයක් මත තවත් චෛත්‍යයක් එහි ඉදිකර ඇත.

අක්ෂෝභය කී ආගිය තොරතුරු සටහන් කරන අතරතුර වෛරෝචනගෙන් උපදෙස් ලැබීමට සිත්විය. වෛරෝචන කොහි ගියාදැයි නොපෙනෙන නමුත් උපදෙස් පතා ඔහු ඇමතීමි.

"පින්වත් වෛරෝචනය විපතට පත් වූවන්ට සැපත වනු පිණිස කර්මශක්ති ප්‍රහාන මූලධර්මය මට කියාදෙනු මැන."

"කර්ම ශක්ති ප්‍රහාන මූලධර්මය මෙසේය. අනුන්ට සතුරුකම් කරන්නන්ට සතුරෝ බහුල වෙති. එවන් සතුරෝ ආත්ම ගණන් පසුපස පන්නාවිත් පළිගනිති. සතුරන්ට වෛර නොකරන්න. මිතුරුදම පතුරන්න. මහා බලගතු පුණ්‍යකර්ම සිදු කිරීමෙන් සතුරන්ගේ බල නැසේ. එවැනි ක්‍රියාවලින් එක්වන පුණ්‍ය බලය නිසා අකුශල කර්ම විපාක යටපත් වන අතර මහා පින් ඇති එවැන්නන්ට එරෙහිව සතුරුකම් කරන පිරිස් අපායටම නියමවෙති. කර්ම ශක්ති ප්‍රහානයෙන් සතුරන් මැඩපවත්වනුයේ එලෙසය."

අක්ෂෝභය බෝසත්හු නැවත පැමිණ බෝධිසත්ව චර්යාව දේශනා කිරීම ඇරඹිය.

"ධර්මප්‍රචාරය පිණිස ලෝකධාතු අතර සැරිසරන බෝසත්වරු විශාල පිරිසක් වෙසෙති. මෙලෙස ධර්මප්‍රචාරයෙහි යෙදීමෙන් බෝධි

චර්යාව දියුණුවෙයි. බෝසත්වරයාගේ බලය වැඩෙයි. යම් කෙනෙකු බුදු වීමට නියත විවරණ ලබන්නේ යම් ලෝකධාතුවක් මත නම් ඒ බෝධිසත්වයාගේ බුද්ධත්වයද එකී ලෝකධාතුව මතම සිදුවෙයි. ප්‍රඥාධික, ශ්‍රද්ධාධික හා වීර්යාධික වශයෙන් බුදුවරු තුන්කොටිධාශයක් සිටිති. ප්‍රඥාධික බුදුකෙනෙකුගෙන් නියත විවරණ ලබා ගත් අය ප්‍රඥාධික බෝසත්වරු බවට පත්වෙති. දීපංකර බුදුන්වහන්සේ ප්‍රඥාධික බුදුවරයෙකු වූ බැවින් උන්වහන්සේගෙන් නියත විවරණ ලත් සුමේධ තාපසයාණෝ ප්‍රඥාධික බෝධිසත්වයෙක් බවට පත්ව සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පෙරුම්පුරා ප්‍රඥාධික බුදුවරයෙකු බවට පත්වූහ. ශ්‍රද්ධාධික හා වීර්යාධික බෝසත්වරුන් ගැනද මෙලෙසම වටහා ගතයුතුය. යමෙකුගේ උපාදානයන් පවතින්නේ ඔහු වසන ලෝකධාතුව මතමය. එබැවින් එක් ලෝකධාතුවකදී නියත විවරණ ලද බෝධිසත්වයෙකු තවත් ලෝකධාතුවකදී බුදුවීම නම් සිදු නොවේමය. එමෙන්ම ලෝකධාතු අතර මාරුවෙමින් වැඩසිටින බුදුවරයෙකු කිසිම ලෝකධාතුවක පහළ වී නොමැත.

ළඟදී සිදුවන්නට නියමිත දෙයක් ඔබට කියමි. සුපිරිසිදු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඔබ විසින් මිනිසුන්ට දේශනා කළ යුතුය. ඒ දේශනාව අසා බොහෝ පිරිසක් එය පිළිගනිති. සමාදන් වෙති. දෙවර්ෂයක් කල් ඉකුත් වූ පසු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පිළිගත් සැමට සුඛාවතියෙහි වැඩ සිටින අමිතාභ බුදුන් දර්ශනය වේ. ඒ අමිතාභ බුදුන්ගේ අධිෂ්ඨාන බලමහිමයේ ස්වභාවයයි.

ඔබගේ ලෝකධාතුවෙහි සමහර පිරිස් බෝධිසත්ව චර්යාව වරදවා අදහති. පාරමිතා ලඝුකොට දැක්වීම වරදකි. දසපාරමිතා ක්‍රමය නිවැරදි වේ. බුද්ධත්වයට පාරමී දම් අවශ්‍ය නැත කීම වරදකි. බෝධිසත්වචරියන් සිටී යයි කීම අසත්‍යයකි."

අනන්ත අපරිමාන සක්වල වාසී සියළු බුදුවරුන්ට මාගේ නමස්කාරය වේවා.

මා දන්නා ධර්මකරුණු ඔබට දේශනා කළේ ගෞතම බුදුන්වහන්සේගෙන් අසා දැනගත් පරිදිය. මාගේ පණිවුඩය සැප කැමති සත්වයන් හට නොපමාව යොමු කරන්න.

ඔබ උපන් සක්වලෙහි හිඳ සසර දුක නසනු විනා සුඛාවතී ලෝක ධාතුවෙහි යළි ඉපිද සසර කෙළවර කරන මගක් ඔවුන්ට නොමැති බව කියන්න. තවද ඔබගේ සක්වලෙහි සද්ධර්මය තවමත් විද්‍යමානය. හැකිතරම් වෙරදරා වහ වහා සත්‍යාවබෝධයට පැමිණෙන්න.

තවද සුඛාවතියෙහි සහ සාග නම් අපගේ ලෝක ධාතුවෙහි සත්ව මාංශ ආහාරයට ගැනීමක් නොමැත්තේය. අපගේ දීර්ඝායුෂයට සහ සෘද්ධි බලයට හේතු වී ඇත්තේ සත්ව මාංශ ආහාරයට නොගැනීමයි. සත්ව මාංශ ආහාරයට ගැනීම ඇරඹීමත් සමග සත්තු මිනිසුන් සමග කථාබහ අත්හරිති.

පිටසක්වලින් පැමිණ අප විසින් දෙසන දහම් සිව් පිළිසිඹියා සහිත අයට පමණක් ඇසෙයි. දැනට ලක්දිවෙහි අට දෙනෙක් සිව්පිළිසිඹියා බලසහිතව සිටිති. ඉන් සයදෙනෙක් පැවිදිබිමෙහි රහත්ව සිටිති. අපගේ දම් දෙසුම අසන ඔබ දෙදෙනාගේ ආශ්චර්යය වනුයේ ගිහිව සිටම නොරහත්ව සිව් පිළිසිඹියා ඥාන ලැබීමයි.

ගෞතම බුදුන්වහන්සේගේද අපූර්වත්වයක් මම දකිමි. මා දන්නා පරිදි අඩුම කලකින් පාරමී දම් සම්පූර්ණ කළේ ගෞතම බුදුන් සිද්ධාර්ථ බෝසතාණන්ය. අඩුම ආයුෂය වළඳන ලද්දේද ගෞතම බුදුන් වහන්සේ විසිනි."

මෙසේ කී අක්ෂෝභය බෝධිසත්ව චර්යාව පිළිබඳ දේශනය අවසන් කළේය.

වෛරෝචන හා අක්ෂෝභය යන දෙදෙනා නැවත පැමිණියහ.

"පරනිර්මිත වශවර්තියෙහි පාලකයාද සේනාපතියෝ දෙදෙනෙක්ද විශේෂ සාකච්ඡාවක යෙදෙති. නාරෝපා විසින් තුසිත දෙව්ලොවින් වජ්‍රායුධය, චක්‍රරත්නායුධය, වාලධීය සහ කඟ්ඩය නම් වූ දිව්‍යායුධ හතර රැගෙන විත් මනුෂ්‍ය ලෝකයෙහි පිහිටුවන ලද්දේය. අපගේ මාර බලය එයින් පරාජයට පත් විය. දැන් ඉතින් මාර වෙසින් පැමිණ බුද්ධ ශාසනය මැඩ පැවැත්විය නොහැක්කේමය. අපගේ නියෝජිත පිරිසක් මිනිස් ලොවට යවා ලංකාවෙහි උපදින්නට නියම කරමු. අපගේ කාර්යය ඒ නියෝජිත පිරිසට භාර දෙමු."

තවද ආක්ෂෝභය බෝසත්හු තවත් වැදගත් කරුණු කිහිපයක් හෙළිදරව් කළහ.

"සාග නම් ලෝ තලය මත මා අමතනු ලබන්නේ අක්ෂෝභය යන නමින් නොවේ. අක්ෂෝභය යනු මිනිසුන් මට යෙදූ අන්වර්ථ නාමයකි. කමක් නැත. අක්ෂෝභය යන නමින් මා ඇමතීමෙහි වරදක් නොකියමි. තවද අමිතාභ බුදුන් ගැන සුවිශේෂ කරුණක් සඳහන් කළ යුතුමය. අමිතාභ බුදුහු බොහෝ කල් සත්වයා වෙත වැඩ සලසා ආයු සංස්කාරය අත්හරිනු කැමතිව, මහණෙනි මම ආයුසංස්කාරය අත්හරිනු කැමැත්තෙමි. එනමුත් බුදුවරයෙකුට කල්පයක් වුවද ජීවත් විය හැක්කේය යනුවෙන් වදාළහ.

නිදුකාණනි අපට අනුකම්පා පිණිස කල්පයක්ම වැඩසිටිනු මැනවැයි ප්‍රතිවදන් ලැබුණි. ඒ ඉල්ලීම පිළිගත් අමිතාභය බුදුහු සුඛාවතිය නැසෙන තෙක්ම එහි වෙසෙති. සියළු සත්වයන් සසරෙන් එතෙර කරවන තුරු අමිතාභ බුදුන් වැඩ සිටින්නේය යන කථාව මාරදූතයන් විසින් ඔබගේ ලොවෙහි ප්‍රචාරය කරන ලද අසත්‍යයකි."

තවද අක්ෂෝභය හා වෛරෝචන මෙසේද කීහ. "සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය බෙදාහැරීම අටමහ කුශල කර්මයන්ට අයත් වේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අසා දැන ගැනීමෙන් සසර කෙටිවේ.

දෙවියන්ගේ රැකවරණයද නිරෝගී සුවයද ලැබේ. ආයුෂ වර්ධනය වේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අවබෝධ කර ගැනීමෙන් සෝවාන් ඵලයෙහි පිහිටයි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර දේශනාවෙන් තුන් පිටකය සම්පූර්ණ වේ. තුන් පිටකය ආරක්ෂා කිරීම සිංහලයන්ට භාර විය. තුන් පිටකය රකින තුරු සිංහල ජාතිය වඳවී යාමක් සිදු නොවන්නේය."

වෛරෝචන තව යමක් හෙළි කිරීමට කැමති බව ප්‍රකාශ කළේය. "ගෞතම බුදුන්වහන්සේ තුසිත දෙව්ලොවට වැඩම කර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරන කල්හි වෙසමුණි රජු සමග මමද එහි ගියෙමි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට නින්දා කරන්නෝ අපාගත වෙති යනුවෙන් ගෞතම බුදුහු වදාළහ.

එවන් පාපකර්මයන් සිදුකර මා වෙත එන අයෙකු වේ නම් ඔහුගේ හෝ ඇයගේ දිවකැපීමට නියම කරමි යනුවෙන් වෙසමුණි රජු කියා සිටියේය. බුදුහු එවිට නිශ්ශබ්දව සිටියහ. වෙසමුණි රජු කී ලෙසම ඒ දෙය සිදුවන්නේමය. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට අවමන් කරන පිරිස අපාගත වෙති. ඔවුහු එහිදී දිව කැපීමේ වධයට ලක්වෙති. මා ඒ දෙය හෙළිකළේ මිනිසුන් කෙරෙහි අනුකම්පාවෙනි."

අනන්ත අප්‍රමාණ ලෝකධාතුවල පහළවන සියළු බුදුවරුන්ට මාගේ නමස්කාරය වේවා. සියළු බෝසත්වරුන්ට මාගේ උපහාරය වේවා. සියළු සත්වයෝ සුවපත් වෙත්වා!

සද්ධර්මය අසද්ධර්මයෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා බුදුන් වහන්සේ විසින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කළ බවට පෙර පෙර පටන් පිළිගැනීමක් ඇත. දැනට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය නමින් ප්‍රචලිතව පවතිනුයේ බුද්ධ දේශණයට අදාල පිරිසිදු සූත්‍ර ධර්මය නොවේ. නාගර්ජුන බමණු පඬිවරයා විසින් මහායානය සංග්‍රහ කරමින් සංස්කෘත භාෂාවෙන් ඉදිරිපත් කරන ලදී.

බුද්ධ දේශනයට ඇතුළත් වූ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඇසුරෙන් බෝධිසත්වවරුන් විසින් දේශනා කරන ලද නිවැරදි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මේ කෘතියට ඇතුලත් වේ. පිටසක්වල ජීවය, ධර්මාවබෝධය සහ අසද්ධර්මය වෙන්කර හඳුනාගැනීම පිළිබඳ දීර්ඝ විස්තර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සඳහන්ය. ගිහි බෞද්ධ ප්‍රතිපදාව කෙසේ විය යුතුද යන්න පිළිබඳ සාර්ථක විග්‍රහයක් මෙහි දෙවන කොටස වන අකෂෝභය තන්ත්‍රයේ දක්වා ඇත.